දෙවනබස සිංහල 10 ශ්‍රේණිය………………



# 10 .වැසි දිනයක්



# 10 වැසි දිනයක්



අපේ පාසලේ තෑගි බෙදාදීමේ උත්සවය ලබන සඳුදා පැවැත්වෙනවා. එහි පිළිගැනීමේ ගීතය ගයන්නේ අපියි. ගීතය පුරුදු වීමට සෙනසුරාදා උදේ ම පාසල් එන්න කියලා ටීචර් අපට කීවා. විදුරත්, මමත් බස් එකෙන් බැහැලා පාසල් වත්තට ඇතුළු වුණා. "චට පටාස්" හඬ නගමින් විදුලි එළියක් විහිදුණා. ඒ සමග ම ගස් අඹරවමින් තද සුළඟක් හමා ගියා.

පසන්, වැස්සක් වහින්නයි හදන්නේ.

ඔව්! ඔව්! ඔන්න ගොරවනවා. ඉක්මනට පන්තියට දුවමු.

විදුර, ඔන්න හයියෙන් ම වැස්ස වහිනවා.

අන්න, සාලියත් එනවා. සාලිය හොඳට ම තෙමිලා.

මග දී වැස්සට අහුවුණා විදුර, කෝ . . . තව ම අපේ යාළුවෝ ඇවිත් නැහැ නේ ?

මේ වැස්සේ කොහොම ද එන්නේ සාලිය?

අර ඈතින් කුඩයක් ඉහළගෙන කවුද එනවා පේනවා.

ආ . . . ඒ එන්නේ සංගීත ටීචර්.

පසන්, ටීචර් හොඳට ම තෙමිලා.

## වැස්සට පෙර පරිසරයේ සිදුවන වෙනස්කම් .



බලන්නකෝ ළමයි, කුඩේ ඉහළගෙන ඇවිල්ලත් තෙමුණා නේ.

කෝ හැමෝ ම ඇවිත් නැහැ නේ.





සුළං හමනවා



විදුලි කොටනවා



අඳුරු වළාකුළු

එළියට බහින්නේ කොහොම ද ටීචර්, පුදුම වැස්සක් නේ වහින්නේ.

තෑගි බෙදාදීමේ උත්සවය සඳහා නේ, පිළිගැනීමේ ගීතය පුරුදු වෙන්නේ කවදා ද?

ටික වේලාවක් බලමු ටීචර්,

ටීචර් ! අපි හෙට ගීතය පුරුදු වෙමු ද?

විදුර, හෙට අනිත් ළමයි එන්නේ කොහොම ද?

ටීචර්, තාරුකා ඉන්නේ පසන්ගේ ගෙවල් ළඟ.
එයාට පුළුවන් තාරුකාට කියන්න.

සාලියට පුළුවන් ගයනිට කියන්න.

ඔව් ටීචර්, අපි අනිත් අයටත් කියන්නම්.

එහෙනම් ඉතින් හෙට පුරුදු වෙමු.

කීයට ද ටීචර් එන්න ඕන?

උදෙන් ම එන්න.

වෙනදා එන වෙලාවට,

රවිඳු ඔයාගේ වයලීනයත් අරගෙන එන්න.

එහෙනම් ඔයාලා පරිස්සමින් ගෙදර යන්න.

හොඳයි ටීචර්.



**පාඩමෙන් ඉගෙන ගත හැකි අලුත් වචන**

பாடத்தில் கற்றுக் கொள்ளக் கூடிய புதிய வாக்கியங்

| | | |
|---|---|---|
| **වැස්ස වහිනවා** | - | மழை பெய்கிறது. |
| **උදෙන්ම වහිනවා** | - | காலையிலேயே பெய்கிறது. |
| **දවසම වහිනවා** | - | நாள் முழுதும் பெய்கிறது. |
| **නිතරම වහිනවා** | - | அடிக்கடி பெய்கிறது. |
| **ටිකක් තෙමිලා** | - | கொஞ்சம் நனைந்துள்ளது. |
| **හුඟක් තෙමිලා** | - | அதிகம் நனைந்துள்ளது. |
| **ගොඩක් තෙමිලා** | - | அதிகம் நனைந்துள்ளது. |
| **හොඳටම තෙමිලා** | - | நன்றாகவே நனைந்துள்ளது. |
| **කවුද එන්නේ?** | - | யார் வருகிறார்? |
| **කොහෙටද එන්නේ?** | - | எங்கே வருகிறா? |
| **කවදාද එන්නේ?** | - | எப்பொழுது வருகிறார்? |
| **කොහොමද එන්නේ?** | - | எப்படி வருகிறார்? |



- **පාඩම ඇසුරින් සංවාදයක් ගොඩ නැංවිය හැකිය..**

ගුරුතුමිය : උදෙන්ම වහිනවා හැමෝම ඇවිල්ලා ද ?

පසන් : එළියට බහින්නේ කොහොමද ? ටීචර් පුදුම වැස්සක් නේ වහින්නේ.

ගුරුතුමිය : උත්සවය සඳුදා නේ .ගීතය පුරුදු වෙන්නේ කවදාද ?

විදුර : අපි හෙට පුරුදු වෙමුද ?

ගුරුතුමිය : හෙට අනිත් ළමයින් එන්නේ කොහොමද ?

පසන් : අපි යාලුවන්ට කියන්නම් .

ගුරුතුමිය : එහෙනම් අපි හෙට පුරුදු වෙමු.

විදුර :කීයටද හෙට එන්නේ..

ගුරුතුමිය : උදෙන්ම එන්න.පරිස්සමෙන් ගෙදර යන්න.

පසන් : හොඳයි ටීචර්